**යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්ක පසු ගැටුම් ප්‍රදේශවල ප්‍රජා - මූල ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2013**

---

යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්ක පසු ගැටුම් ප්‍රදේශවල ප්‍රජා - මූල ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 අගෝස්තු 01 දින එළඹි අංක 9154 එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ II (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්ක පසු ගැටුම් ප්‍රදේශවල ප්‍රජා - මූල ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජා ජ ස ජ ම), ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව, වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව, සහ කරච්චි ප්‍රාදේශීය සභාව විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන ලෙස සේවය සලසනු ලැබේ. ව්‍යාපෘතියේ මූලික අරමුණු වන්නේ, ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම මඟින් පසු ගැටුම් ග්‍රාමීය ප්‍රජාවගේ හා යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල අභ්‍යන්තරිකව අවතැන්ව නැවත පැමිණෙන ජනතාවගේ දිළිඳු කම අඩුකිරීම සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 2.42 ක් වන අතර ඉන් එ ජ ඩො මිලියන 2 ක් හෙවත් මුළු පිරිවැයෙන් සියයට 83 ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යායනය කිරීමට දිළිඳුකම දුරලීම සඳහා ජපන් අරමුදල (J F P R) විසින් එකඟ වී තිබුණි. එජඩො මිලියන 0.26 ක් හෙවත් මුළු පිරිවැයෙන් සියයට 11 ක් ශ්‍රී ලංකා රජය (ශ්‍රී ලං ර) විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණු අතර ශේෂය වූ එ ජ ඩො 0.16 හෙවත් මුළු පිරිවැයෙන් සියයට 6 ක් ප්‍රජා දායකත්වය විසින් මූල්‍යායනය කළ යුතුය. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 අගෝස්තු 01 දින ආරම්භ කරන ලද අතර 2014 ජූනි 30 වනවිට නිමකිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක්

ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂා කිරීම් ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වු වත්කම් සහ වගකීම් ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම්, ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුම්වලින් ආපසු ගැනීම් හා එම ගිණුම්වලට කරන ලද ඌනපූරණයන් ව්‍යාපෘතියේ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව සහ

(ඌ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා

සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.69,320,374 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.72,776,252 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 28,928,473 | - | 28,928,473 |
| කාර්යාල ලී බඩු | 142,729 | 2,010,040 | 2,152,769 |
| මෝටර් වාහන | 13,211,940 | - | 13,211,940 |
| පුහුණු වැඩමුළු | 656,906 | - | 656,906 |
| සැලසුම් කිරීම හා අධීක්ෂණය සඳහා උපදේශක සේවා | 15,016,612 | - | 15,016,612 |
| සමාජ අනුරූපනය සඳහා උපදේශක සේවා | 222,900 | - | 222,900 |
| ව්‍යාපෘති කළමනාකරණය | 11,140,814 | 1,445,838 | 12,586,652 |
| එකතුව | 69,320,374 | 3,455,878 | 72,776,252 |

### 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 61,649 | 7,839,369 |
| එකතුකළා :- ඌනපූරණයන් | 149,842 | 19,629,874 |
| විදේශ විනිමය වාසිය | - | 271,183 |
| | ------------- | ------------- |
| | 211,491 | 27,740,426 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 148,967 | 19,565,207 |
| | ------------- | ------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 62,524 | 8,175,219 |
| | ======== | ======== |

## 5. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් වර්ෂය අවසන් වී මාස 06 ක් ඇතුළත විගණිත මූල්‍ය ප්‍රකාශන ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනයට ඉදිරිපත් කළ යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2014 අගෝස්තු 21 දිනදීය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රජා මූල සංවිධානවල සාමාජිකයන්ට ගෙවිය යුතු එකතුව රු.368,280 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘතියේ ගනුදෙනු විගණනයට භාජනය කර නොතිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම අනුව ලබාදීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2013 වර්ෂය තුළ | 2013 දෙසැම්බර් 31 දිනට | |
| | එ ජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන |
| දිළිඳුකම දුරලීම | 2.00 | 221.70 | 90.00 | 59.31 | 0.47 | 61.75 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සඳහා ජපන් අරමුදල (JFPR) | | | | | | |
| ශ්‍රී ලංකා රජය | 0.26 | 28.82 | 10.00 | 10.01 | 0.08 | 11.03 |
| ප්‍රජා දායකත්වය | 0.16 | 17.74 | - | - | - | - |
| එකතුව | 2.42 | 268.26 | 100.00 | 69.32 | 0.55 | 72.78 |

ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් මාස 24 ක් ගතවීමෙන් පසුවත් ව්‍යාපෘති කාර්යයන් සඳහා වෙන් කරන ලද මුළු ප්‍රදානයෙන් සියයට 29.64 ක් නියෝජනය වන එ ජ ඩො 72,776,252 ක් ව්‍යාපෘතිය විසින් 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කර තිබුණි.එබැවින් ව්‍යාපෘතියේ ඉතිරි මාස 21 ක කාලය පරිච්ඡේදය තුළ එ ජ ඩො 177,845,178 ක ඉතිරි මුදල උපයෝජනය කිරීම සැකසහිතය.

## 6.2 භෞතික කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජුනි 30 වන විට ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කර තිබුණද, ව්‍යාපෘතිය විසින් පිළියෙල කර තිබූ ප්‍රගති වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 40 ක් හා සියයට 25.72 ක් විය.

(ආ) ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව අනුව, 2013 දෙසැම්බර් 31 දිනට ඩෙල්ෆ්, සරපිටි හි ළිඳක ඉදිකිරීම සියයට 90 ක් නිමකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද එම වැඩවලින් සියයට 40 ක් එදිනට නිම කර තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට නිම කිරීම සඳහා සැලසුම් කරන ලද ව්‍යාපෘතියේ කාර්යයන් 24 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව තුළ කාර්යයන් 19 ක් ආරම්භ කර තිබුණි.